සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| **ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I**<br>கிறிஸ்தவ நாகரிகம் I<br>Christian Civilization I | **49 S I** | **පැය දෙකයි**<br>*இரண்டு மணித்தியாலம்*<br>*Two hours* |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ශිෂ්ටාචාරයේ තොටිල්ල වශයෙන් හඳුන්වනු ලබන්නේ,
(1) ඊජිප්තුවයි. (2) ඉන්දු නිම්නයයි.
(3) රෝමයයි. (4) ග්‍රීසියයි.
(5) මෙසපොතේමියාවයි.

**2.** පහත ප්‍රකාශ සලකන්න.
A - දර්ශනය සහ විද්‍යාත්මක ගවේෂණයට මුල පිරීම
B - මුදල් පරිහරණය හඳුන්වා දීම
C - ජ්‍යොතිෂය, උද්භිද විද්‍යාව සහ වෛද්‍ය විද්‍යාව වැඩිදියුණු කිරීම
D - කෘෂිකර්මය සහ මුහුදු මාර්ගික වෙළඳාම වැඩිදියුණු කිරීම
E - ලේඛන කටයුතු සඳහා පැපිරස් භාවිත කිරීම

මේවායින් ග්‍රීක සංස්කෘතියෙන් ලොවට දායාද කරන ලද්දේ මොනවාද?
(1) A, B සහ C (2) A, C සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**3.** පුරාණ නිපූර් නගරය පිහිටා තිබුණේ,
(1) බැබිලෝනියාවේ ය. (2) ඊජිප්තුවේ ය.
(3) ග්‍රීසියේ ය. (4) ජෝර්දානයේ ය.
(5) ඊදොම්හි ය.

**4.** රෝම ශිෂ්ටාචාරයට සම්බන්ධ **නොවන** ප්‍රකාශය කුමක් ද?
(1) අධිරාජ්‍යයේ පරිපාලනය සහ දේශපාලන සහජීවනයක් පැවතීම
(2) දෙවියන්, දේවතාවියන් සහ වීරයන් වෙනුවෙන් උත්සව පැවැත්වීම
(3) අධිරාජ්‍යයේ ආගමික සහ දේශපාලන සහජීවනයක් පැවතීම
(4) ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටයන් වීම
(5) ලෝකයේ ප්‍රථම දින දර්ශනය නිර්මාණය කිරීම

**5.** පහත ප්‍රකාශ සලකන්න.
A - හනුක්කා අස්වැන්න මංගල්‍යයකි.
B - පෙන්තකොස්තය අස්වැන්න මංගල්‍යයකි.
C - පෙන්තකොස්ත මංගල්‍යය 'යෝම් කිප්පූර්' යන නමින් හැඳින්වේ.
D - කූඩාරම් මංගල්‍යය 'සුක්කොත්' යනුවෙන් හැඳින්වේ.
E - පාස්කු මංගල්‍යය මාර්තු-අප්‍රේල් මාසවලදී සිදු කරයි.

මේවායින් ඊශ්‍රායල්වරුන්ගේ මංගල්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ E (3) B, C සහ D (4) B, C සහ E (5) B, D සහ E

[දෙවැනි පිටුව බලන්න.

**6.** ක්‍රි.ව. 6 දී රෝම අධිරාජයා විසින් බලයෙන් පහකළ ජුදා පාලකයා වන්නේ,
(1) මහ හෙරෝද් ය. (2) පිලිප් ය.
(3) පළමුවන අග්‍රිපා ය. (4) ආර්කෙලාවුස් ය.
(5) හෙරෝද් අන්තිපස් ය.

**7.** ගෙර්සිම් කන්ද පිහිටා ඇත්තේ,
(1) සමාරියාවෙහි ය. (2) ජුදයාවෙහි ය.
(3) ඉහළ ගලීලයේ ය. (4) පහළ ගලීලයේ ය.
(5) ජෝර්දානයේ ය.

**8.** එලිජා දිවැසිවරයා ජීවත් වූයේ කුමන රජතුමාගේ කාලයේ දී ද?
(1) සලමොන් (2) ජෙරබොවාම්
(3) ආහබ් (4) ජොසියා
(5) සෙඩකියා

**9.** එස්රා අයත් වන්නේ කුමන පෙළපතකට ද?
(1) ජුදා (2) බෙන්ජමින්
(3) මනස්සේ (4) එප්‍රායිම්
(5) ආරොන්

**10.** පහත ප්‍රකාශ සලකන්න.
A - බෙතල් පිහිටා ඇත්තේ සමාරියාවෙහි ය.
B - රෙහෙබොවාම් රජ කළේ සමාරියාවෙහි ය.
C - ජෙරබොවාම් රජ කළේ සමාරියාවෙහි ය.
D - සමාරියාවෙහි අවසාන රජ වන්නේ සෙඩකියා ය.
E - ජාකොබ්ගේ ළිඳ පිහිටා ඇත්තේ සමාරියාවෙහි ය.

මේවායින් සමාරියාවට සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ E ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**11.** "එහෙත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යය ද ධර්මිෂ්ඨකම ද සොයන්න. එවිට මේ සියල්ල ඔබට දෙනු ලැබේ." (මතෙව් 6:33). ක්‍රිස්තුන්වහන්සේ මේ වචන වදාළේ,
(1) ගලීලයේ මුහුද අසබඩ දී ය.
(2) ශ්‍රාවකයන් කැඳවනු ලැබූ අවස්ථාවේ දී ය.
(3) අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේ දී ය.
(4) කන්ද උඩ දේශනාවේ දී ය.
(5) කුරුස ගසේ දී ය.

**12.** මුල් කිතුනුවන්ගේ ගුණාංග තුනක් ඇතුළත් වරණය කුමක් ද?
(1) සාමූහික ජීවිතය, අන්‍ය භාෂා කථා කිරීම සහ යාච්ඤාව
(2) බෙදාගැනීම, සාමූහික ජීවිතය සහ දුක්ප්‍රාප්තිය මෙනෙහි කිරීම
(3) යාච්ඤාව, එක්සත් බව සහ බෙදාගැනීම
(4) එක්සත් බව, දුක්ප්‍රාප්තිය මෙනෙහි කිරීම සහ යාච්ඤාව
(5) එක්සත් බව, අන්‍ය භාෂා කථා කිරීම සහ යාච්ඤාව

**13.** කිතුනුවන්ට ප්‍රථමයෙන් පීඩා කරනු ලැබුවේ,
(1) පාවුලුතුමා ය. (2) ඩොමීෂියන් ය.
(3) නීරෝ ය. (4) ට්‍රාජන් ය.
(5) වැලේරියන් ය.

**14.** රෝම පීඩන සමයෙහි විසූ 'දෙවිඳුන් දරන්නා' යන විරුදාවලිය ලැබූ ප්‍රාණ පරිත්‍යාගිවරයා කවුද?
(1) ශුද්ධ වූ පේදුරුතුමා
(2) ශුද්ධ වූ තිමෝතිතුමා
(3) ශුද්ධ වූ ජස්ටින්තුමා
(4) ශුද්ධ වූ සිසිලියා මුනිවරිය
(5) අන්තියෝකයේ ශුද්ධ වූ ඉග්නේෂියස්තුමා

[තුන්වැනි පිටුව බලන්න.

0635

**15.** ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භක යුගයේ පැවති ග්‍රීක දාර්ශනික චින්තනයන් තුනක් ඇතුළත් වරණය කුමක් ද?
(1) ස්ටොයිකවාදය, ප්ලෙටොනික්වාදය සහ නොස්ටික්වාදය
(2) ස්ටොයිකවාදය, නොස්ටික්වාදය සහ ඇරිස්ටොටේලියන්වාදය
(3) නොස්ටික්වාදය, ඩොසටික්වාදය සහ මැනිකියන්වාදය
(4) ප්ලෙටොනික්වාදය, ස්ටොයිකවාදය සහ මැනිකියන්වාදය
(5) ප්ලෙටොනික්වාදය, ඇරිස්ටොටේලියන්වාදය සහ එපිකියුරියන්වාදය

**16.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - තාර්සස්හි උපත ලැබීය.
B - උපතින් රෝම පුරවැසිභාවය උරුම වූවෙකි.
C - ජෙරුසලම කරා යද්දී සිත්හැරීම සිදුවිය.
D - ගමාලියෙල් නමැති පඬිවරයා යටතේ ඉගෙනුම ලැබීය.
E - ශුද්ධ වූ ජාකොබ්තුමන්ගේ ගෝලයෙකි.
මේවායින් ශුද්ධ වූ පාවුලුතුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**17.** ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ ක්ලෙමන්ට්තුමා විසින් රචිත ග්‍රන්ථ දෙකක් වන්නේ,
(1) ග්‍රීකයන්ට උපදෙස් සහ පේළි හයක ශුද්ධ බයිබලයයි.
(2) කිතු දහමේ හඳුන්වා දීම සහ ක්‍රිස්තු වේද ආධාරකයයි.
(3) ඇපොලොජියා සහ ග්‍රීකයන්ට උපදෙස් ය.
(4) කිතු දහමේ හඳුන්වා දීම සහ ග්‍රීකයන්ට උපදෙස් ය.
(5) කිතුනු විශ්වාසය සහ පේළි හයක ශුද්ධ බයිබලයයි.

**18.** ක්‍රිස්තුන්වහන්සේ විසින් තම දුක් විඳීම හා මරණය පිළිබඳව ශ්‍රාවකයන්ට පුරෝකතනය කළේ කුමන අවස්ථාවේදීද?
(1) ජෝර්දාන් නදියෙන් බෞතිස්මය ලැබූ විට ය.
(2) විනයධරයන් සමඟ සාකච්ඡා කළ අවස්ථාවේ දී ය.
(3) ස්නාවක ජුවාම්තුමාගේ මරණයෙන් පසුව ය.
(4) පේදුරුතුමාගේ නැන්දනිය සුව කළ අවස්ථාවේ දී ය.
(5) "මෙසියස් යැයි ඔබ සිතන්නේ කවුරුන් ද" කියා ප්‍රශ්න කළ පසුව ය.

**19.** පහත සඳහන් යුගල අතුරෙන් එකිනෙකට ගැළපෙන යුගලය කුමක් ද?
(1) සෙප්ටුවාජින්ත - ග්‍රීසියේ සාමාන්‍ය ජනතාව භාවිත කළ භාෂාව
(2) තාර්ගුම් - බයිබලයේ ඇරමෙයික් පරිවර්තනය
(3) වල්ගේට් - ඉන්දු භාෂා පවුලට අයත් ය
(4) කොයිනේ - බයිබලයේ ග්‍රීක පරිවර්තනය
(5) ග්‍රීක භාෂාව - බයිබලයේ ලතින් පරිවර්තනය

**20.** මුල් සභාවේ භාවිත සංකේත අතුරෙන් 'මත්ස්‍යයා' මගින් සංකේතවත් වන්නේ,
(1) පූප වැඩි කිරීමයි. (2) අන්තිම රාත්‍රී භෝජනයයි.
(3) ක්‍රිස්තුන්වහන්සේයි. (4) අපෝස්තුළුවරුන්ගේ කැඳවීමයි.
(5) දිව්‍ය සත්ප්‍රසාදයයි.

**21.** නිසියාන, එපීසිය සහ කැල්සඩෝන යන මන්ත්‍රණ සභාවන්ට පාදක වූ වේද භේදයන් අනුපිළිවෙලින්,
(1) ඒරියන්වාදය, මැසදෝනියවාදය සහ නෙස්ටෝරියන්වාදයයි.
(2) ඒරියන්වාදය, නෙස්ටෝරියන්වාදය සහ එව්ටිකියන්වාදයයි.
(3) මැසදෝනියවාදය, නෙස්ටෝරියන්වාදය සහ නොස්ටික්වාදයයි.
(4) මැසදෝනියවාදය, නෙස්ටෝරියන්වාදය සහ එව්ටිකියන්වාදයයි.
(5) නෙස්ටෝරියන්වාදය, නොස්ටික්වාදය සහ එව්ටිකියන්වාදයයි.

**22.** පෙරදිග හා අපරදිග තාපස ජීවිතයට ක්‍රමවත් නීති පද්ධති හඳුන්වා දුන් දෙදෙනා කවුරුන් ද?
(1) ශුද්ධ වූ බැසිල්තුමා සහ ශුද්ධ වූ බෙනඩික්තුමා ය.
(2) තිබ්ස් හි ශුද්ධ වූ පාවුලුතුමා සහ ශුද්ධ වූ පකෝමියස්තුමා ය.
(3) ඊජිප්තුවේ ශුද්ධ වූ අන්තෝනිතුමා සහ ශුද්ධ වූ බෙනඩික්තුමා ය.
(4) ශුද්ධ වූ පකෝමියස්තුමා සහ ශුද්ධ වූ බැසිල්තුමා ය.
(5) තිබ්ස් හි ශුද්ධ වූ පාවුලුතුමා සහ ශුද්ධ වූ බෙනඩික්තුමා ය.

**23.** ශුද්ධ වූ පාවුලුතුමාගේ තුන්වන ධර්ම දූත ගමනට එක් වූ ශ්‍රාවකයන් ඇතුළත් වරණය කුමක් ද?
(1) මාර්ක්, ලූක් සහ බර්ණබස් (2) බර්ණබස්, තිමති සහ ලූක්
(3) මාර්ක්, ටයිටස් සහ තිමති (4) තිමති, ටයිටස් සහ ලූක්
(5) ලූක්, තිමති සහ මාර්ක්

**24.** පහත සඳහන් කරුණු සලකන්න.
A - ඔහු රෝම ජාතිකයෙකි.
B - පාප උච්චාරණය (ජීවිත වාර්තාව) නැමැති ග්‍රන්ථයෙහි එතුමන්ගේ ජීවිතය ගැන සඳහන් කරයි.
C - ඔහුගේ මව ශාන්ත හෙලේනාතුමියයි.
D - ඔහු ශ්‍රේෂ්ඨ චින්තකයෙකු හා රදගුරුතුමෙක් වෙයි.
E - සාන්ත අම්බ්‍රෝස්තුමාගේ මග පෙන්වීම මත ඔහු ජීවිතය වෙනස් කරගත්තේ ය.
මේවායින් ශුද්ධ වූ අගුස්තීනුතුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවාද?
(1) A, B සහ C ය. (2) A, C සහ D ය. (3) B, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**25.** පැට්රික්තුමා, කැන්ටබරියේ අගුස්තීනු තාපසතුමා සහ කොලොම්බන්තුමා සේවය කළ රටවල් අනුපිළිවෙලින් සඳහන් වරණය කුමක් ද?
(1) එංගලන්තය, අයර්ලන්තය සහ ස්කොට්ලන්තය
(2) අයර්ලන්තය, ස්කොට්ලන්තය සහ ජර්මනිය
(3) එංගලන්තය, අයර්ලන්තය සහ ජර්මනිය
(4) අයර්ලන්තය, එංගලන්තය සහ ස්කොට්ලන්තය
(5) අයර්ලන්තය, ජර්මනිය සහ එංගලන්තය

**26.** බෙනදික්තාන නිකායේ ප්‍රධාන දායකත්වයක් **නොවන්නේ** කුමක් ද?
(1) පැවිදි ජීවිතය සඳහා නීති මාලාවක් හඳුන්වාදීම
(2) යුරෝපයේ ගෝත්‍රිකයන්ගේ සිත්හැරීමට දායකවීම
(3) ශුද්ධ වූ බයිබලය ගැඹුරින් හැදෑරීමට යොමු කිරීම
(4) සමාජ සේවා කටයුතුවල නියැලීම
(5) යුරෝපයේ අධ්‍යාපනයේ දියුණුවට කටයුතු කිරීම

**27.** පහත සඳහන් කරුණු සලකන්න.
A - පෙර-අපරදිග සභාවේ නායකයන් අතර ගැටුම්
B - බයිබලයේ සම්මත ග්‍රන්ථ සංඛ්‍යාව පිළිබඳ ගැටලුව
C - 'ෆිලියෝක්වේ' යන ඉගැන්වීම පිළිබඳ ගැටලුව
D - පූර්ණඵල වෙළඳාම පිළිබඳ ගැටලුව
E - විශ්වාසයේ ප්‍රතිපත්තිවල වැදගත්කම
මේවායින් පෙර-අපරදිග සභා භේදයට තුඩුදුන් කරුණු මොනවාද?
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ E ය. (4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**28.** කුරුස යුද්ධය ඇතිවීමට හේතුව වන්නේ,
(1) මුස්ලිම්වරුන් සමග වූ අර්බුදයයි.
(2) කොන්ස්තන්තිනෝපල් නගරය යටත්කර ගැනීමයි.
(3) මුස්ලිම්වරුන් යුරෝපයට පැමිණීම වැළැක්වීමයි.
(4) මැද පෙරදිග කිතු දහම පැතිරවීමයි.
(5) ශුද්ධ වූ දේශය මුස්ලිම්වරුන්ගෙන් නිදහස් කර ගැනීමට අවශ්‍ය වීමයි.

**29.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - ගලීලයේ පිහිටා ඇත.
B - ජුදෙයාවේ පිහිටා ඇත.
C - ජුදා ජාතියේ සංකේතයයි.
D - දාවිත් රජු විසින් ගොඩනගන ලදී.
E - සලමොන් රජු විසින් ගොඩනගන ලදී.
මේවායින් ජෙරුසලෙම් දේව මාලිගය පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවාද?
(1) A, B සහ C ය. (2) A, B සහ E ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) B, D සහ E ය.

**30.** පහත ප්‍රකාශ සලකන්න.

A - සභාව ලෞකිකත්වයට බරවීම.

B - සභා නායකයන්ගේ සදාචාරයෙන් තොර හැසිරීම.

C - පුනරුදයෙන් වූ බලපෑම.

D - පූර්ණඵල විකිණීම හා අධික බදු අය කිරීම.

E - ශුද්ධ රෝම අධිරාජ්‍යයෙන් නිදහස් වීමට තිබූ උවමනාව.

මේවායින් ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයට බලපෑ ප්‍රධාන හේතු මොනවාද?

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**31.** ආධ්‍යාත්මික දියුණුව සඳහා ජාකොබුස් දේ ඔරාජිනේතුමා විසින් සම්පාදනය කළ ග්‍රන්ථය වන්නේ,

(1) ආත්මික ජීවිතය (2) ක්‍රිස්තුන්වහන්සේගේ ජීවිතය

(3) ශුද්ධවන්තයන්ගේ ජීවිතය (4) ක්‍රිස්තු අනුසාරය

(5) දේව සුබාන්තය

**32.** ආත්මික ප්‍රතිසංස්කරණයන්ට මගපෙන්වීම සඳහා කුරුසියේ ජුවාම්තුමා විසින් රචිත ග්‍රන්ථ දෙකක් වන්නේ,

(1) පූර්ණ දිවියකට මග සහ ඇතුළාන්ත මාලිගාව

(2) පූර්ණ දිවියකට මග සහ කාර්මෙල් සභාවේ නැගුම

(3) ඇතුළාන්ත මාලිගාව සහ ආධ්‍යාත්මික ගීතය

(4) ආත්මික ජීවිතය සහ ආත්මයේ අඳුරු රාත්‍රිය

(5) ප්‍රේමයේ නොනිවෙන ගිනිදළු සහ ආධ්‍යාත්මික ගීතය

**33.** ලියනාර්ඩෝ ඩා වින්චි විසින් සිත්තම් කළ ලෝ ප්‍රකට චිත්‍ර දෙකක් වන්නේ,

(1) අන්තිම රාත්‍රී භෝජනය සහ ලෝකය මැවීම යි.

(2) මොනාලිසා සහ ආදම් මැවීම යි.

(3) අන්තිම රාත්‍රී භෝජනය සහ අවසාන විනිශ්චය යි.

(4) මොනාලිසා සහ අවසාන විනිශ්චය යි.

(5) අන්තිම රාත්‍රී භෝජනය සහ මොනාලිසා ය.

**34.** යුරෝපය තුළ බිහි වූ මුල් විශ්වවිද්‍යාල ත්‍රිත්වයක් වන්නේ,

(1) බොලොඤ්ඤා, පැරිස් සහ හාර්වඩ් විශ්වවිද්‍යාලයයි.

(2) සලමන්කා, පැරිස් සහ ජෙනෝවා විශ්වවිද්‍යාලයයි.

(3) බොලොඤ්ඤා, කේම්බ්‍රිජ් සහ මිලාන් විශ්වවිද්‍යාලයයි.

(4) බොලොඤ්ඤා, පැරිස් සහ සලමන්කා විශ්වවිද්‍යාලයයි.

(5) පැරිස්, කේම්බ්‍රිජ් සහ වියෙන්නා විශ්වවිද්‍යාලයයි.

**35.** ජෝන් මිල්ටන් (විල්ටන්) විසින් ලියන ලද නවකථාව වන්නේ,

(1) වන්දනාකරුවන්ගේ ගමන ය.

(2) ක්‍රිස්තු අනුසාරය ය.

(3) නැතිවූ පාරාදීසය ය.

(4) පූර්ණත්වයේ මග ය.

(5) ඇතුළාන්ත මාළිගාව ය.

**36.** තමන්ගේ ආගම වශයෙන් කිතු දහම තෝරාගත් පළමු ආසියාතික රට වන්නේ,

(1) ආර්මේනියාව ය. (2) පිලිපීනය ය.

(3) තුර්කිය ය. (4) ඉරාන ය.

(5) චීනය ය.

**37.** රෝමානු කතෝලික සභාව තුළ සිටිමින් ස්වාධීනව ක්‍රියා කරන සිරියානු සම්ප්‍රදායට අයත් සභාව කුමක් ද?

(1) සීරෝ මලබාර් සභාවයි.

(2) ලතින් සභාවයි.

(3) මාර් තෝමා සභාවයි.

(4) කොප්ටික් සභාවයි.

(5) මලංකාර් සිරියන් ඕර්තඩොක්ස් සභාවයි.

**38.** මතේඕ රිච්චි පියතුමන් විසින් රචිත ග්‍රන්ථය වන්නේ,
(1) ප්‍රැන්සිස් සේවියර්තුමන්ගේ ප්‍රාණපරිත්‍යාගිවරු පිළිබඳ ග්‍රන්ථය ය.
(2) ක්‍රිස්තියානි සභා පිළිබඳ විස්තරය ය.
(3) සත්‍ය දේව ගුණාංගය ය.
(4) බැබලෙන ධර්මය ය.
(5) වන්දනාකරුවන්ගේ ගමන ය.

**39.** පිලිපීන ජනතාවගේ සිත් ඇදගත් ස්පාඤ්ඤ ධර්මදූතයන්ගේ ක්‍රියාකාරකම් මොනවා ද?
(1) ආහාර පාන විධි, වන්දනාව සහ යාච්ඤාව
(2) උත්කෘෂ්ඨවත් මංගල්ල, යාච්ඤාව සහ වන්දනාව
(3) බටහිර ජීවිත ක්‍රමය, වන්දනාව සහ සාන්තුවර භක්තිය
(4) සාන්තුවර භක්තිය, යාච්ඤාව සහ බටහිර ජීවිත ක්‍රමය
(5) උත්කෘෂ්ඨවත් මංගල්ල, වන්දනාව සහ ආහාර පාන විධි

**40.** ශ්‍රී ලංකාව පාලනය කළ යුරෝපීය ජාතිකයන් අධ්‍යාපනයේ වර්ධනය සඳහා උනන්දු වීමට හේතුවක් වන්නේ කුමක් ද?
(1) ඔවුන්ගේ පාලනයට පහසුකම් සැපයීම.
(2) ඔවුන් පාලනය කළ සෑම රටකම අධ්‍යාපනය වැඩිදියුණු කිරීම ඔවුන්ගේ ප්‍රතිපත්තියක් වීම.
(3) ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරයේ (ධර්ම දානයේ) මාර්ගයක් වශයෙන් අධ්‍යාපනය සැලකීම.
(4) රට සංවර්ධනය කිරීමට අධ්‍යාපනය හේතුවක් වීම.
(5) අධ්‍යාපනය මනුෂ්‍යයාගේ මූලික අයිතිවාසිකමක් ලෙස සැලකීම.

**41.** 'මානව උදාරත්වය' ප්‍රධාන තේමාවක් වන දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ලේඛනය වන්නේ,
(1) ජනවන්දනාව පිළිබඳ ප්‍රකාශයයි.
(2) වර්තමාන ලෝකය තුළ ශුද්ධවූ සභාව පිළිබඳ ප්‍රකාශයයි.
(3) ශුද්ධ වූ සභාව පිළිබඳ ප්‍රකාශයයි.
(4) ජන මාධ්‍යය පිළිබඳ ප්‍රකාශයයි.
(5) පූජක පුහුණුව පිළිබඳ ප්‍රකාශයයි.

**42.** දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසින් ලියූ සමාජ විශ්ව ලේඛන වන්නේ,
(1) අයුක්තියට පිළිතුර, මනුෂ්‍යයන්ගේ ගැළවුම්කරුවාණෝ සහ දෙවියන් වහන්සේ ප්‍රේමය යි.
(2) වෙහෙසෙන මිනිස්සු, ජනතා ප්‍රගතිය සහ මානව ශ්‍රමය යි.
(3) සියවන වසර, අයුක්තියට පිළිතුර සහ දෙවියන් වහන්සේ ප්‍රේමය යි.
(4) මනුෂ්‍යයන්ගේ ගැළවුම්කරුවාණෝ, මානව ශ්‍රමය සහ සමාජ සැලකිල්ල යි.
(5) ජනතා ප්‍රගතිය, මානව ශ්‍රමය සහ ප්‍රශංසා වේවා මා සමිඳුනි යි.

**43.** ලෝක සභා සම්මේලනය සහ එක්වීමට කැමැත්ත නොදැක්වූ සභා විසින් පිහිටුවා ගත් සංවිධානය වන්නේ,
(1) ලෝක එවැන්ජිකල් සංවිධානයයි.
(2) විශ්වාසය සහ ක්‍රමවත් බව සඳහා වන කොමිසමයි.
(3) ජාත්‍යන්තර මිෂනාරි සංගමයයි.
(4) කිතුනු අධ්‍යාපනය සඳහා ලෝක සංවිධානයයි.
(5) ජීවිතය සහ සේවය සඳහා වන පෙරමුණයි.

**44.** ඉපැරණි ප්‍රසාද ස්නාපන බඳුනක් හමු වූ ස්ථානය කුමක් ද?
(1) අනුරාධපුරය
(2) පොළොන්නරුව
(3) දඹදෙනිය
(4) සීගිරිය
(5) වව්නියාව

**45.** එකමුතු සතිය ලොව පුරා පැතිර වූ ශුද්ධෝත්තම පියතුමා වන්නේ,
(1) IX පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
(2) X පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
(3) XIII ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.
(4) VI පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
(5) XV බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.

**46.** ආසියානු සභාව නැමැති අපෝස්තලික අනුශාසනා පත්‍රයට අනුව දේව අනාවරණය සිදු වූ භූමිය කුමක් ද?
(1) ඔස්ට්‍රේලියාව
(2) ආසියාව
(3) යුරෝපය
(4) දකුණු ඇමරිකාව
(5) අප්‍රිකාව

● පහත වගුව ඇසුරෙන් අංක **47** සිට **50** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| ගරු ජේ විත්සන් පියතුමා | වෙස්ලියන් ධර්මදූතවරු | පිලිප් බල්දෙවුස් දේවගැතිතුමා | ගරු මයිකල් රුදිගු පියතුමා |
| **E** | **F** | **G** | **H** |
| අපගේ ආගමේ වැදගත් ආඥා | සුබසෙත් ගෙදර | සාන්ත ලෝරන්ස් දේවස්ථානය, කොළඹ | රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ල |

**47.** පෘතුගීසි පාලන සමය හා සම්බන්ධ යුගලය වන්නේ,
(1) A සහ G ය. (2) A සහ H ය. (3) B සහ E ය. (4) C සහ F ය. (5) D සහ G ය.

**48.** කැල්වින් වාදය හා බැඳුණු යුගලය වන්නේ,
(1) A සහ E ය. (2) B සහ G ය. (3) C සහ E ය. (4) C සහ F ය. (5) D සහ H ය.

**49.** බ්‍රිතාන්‍ය පාලන යුගය හා සම්බන්ධ යුගලය වන්නේ,
(1) A සහ G ය. (2) B සහ H ය. (3) C සහ E ය. (4) C සහ H ය. (5) D සහ G ය.

**50.** ශ්‍රී ලංකාවේ නිදහසෙන් පසු යුගයට සම්බන්ධ යුගලය වන්නේ,
(1) A සහ E ය. (2) B සහ G ය. (3) C සහ G ය. (4) D සහ F ය. (5) D සහ H ය.

* * *

 0635

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) කිතුනු ජනවන්දනාවට බල පෑ රෝම ආගමික සිරිත් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 2යි)

   (ii) ගලීලය ප්‍රදේශයේ පිහිටි භූගෝලීය සාධක **හතරක්** දක්වන්න. (ලකුණු 4යි)

   (iii) සීනයි ගිවිසුමේ ලක්ෂණ මොනවා දැයි විස්තර කරන්න. (ලකුණු 6යි)

   (iv) ඊජිප්තු සහ මෙසපොතේමියානු ශිෂ්ටාචාර, ජුදා සංස්කෘතිය කෙරෙහි බල පෑ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 8යි)

2. (i) ඊශ්‍රායලයේ දෙවියන්වහන්සේ හඳුන්වන ලද නම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 2යි)

   (ii) ජුදා යාච්ඤාවල දැකිය හැකි ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 4යි)

   (iii) ක්‍රිස්තුන්වහන්සේගේ කාලයේදී ජුදා සමාජයේ කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 6යි)

   (iv) අර්කෙලාවුස්, පිලිප් සහ හෙරෝද් ඇන්ටිපස්ගේ පාලනය ඇතුළුව, ක්‍රිස්තුන්වහන්සේගේ කාලයේ පැවති දේශපාලන තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 8යි)

3. (i) ක්‍රිස්තියානි සංගීත වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 2යි)

   (ii) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූ කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 4යි)

   (iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට පීටර් පිල්ලේ පියතුමන්ගේ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 6යි)

   (iv) ශුද්ධ වූ තෝමස් ඇක්වයිනස්තුමන්ගේ ඉගැන්වීම් මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 8යි)

## II කොටස

**4.** (i) ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය සහ මරණය පිළිබඳව සුවිශේෂක ජොහාන්තුමන්ගේ ඉගැන්වීම් ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

(ii) ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ උත්ථානය ක්‍රිස්තියානිවරුන්ට ඔවුන්ගේ ඇදහිල්ල වර්ධනය කර ගැනීමට උපකාරී වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**5.** (i) විශේෂ තීරණ ගැනීමේදී සහ ශුභාරංචිය පතල කිරීමේදී මුල් සභාව සැමවිටම ශුද්ධාත්මයාණන් කෙරෙහි විශ්වාසය තබා ක්‍රියා කළ ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) වත්මන් ලෝකය තුළ කිතුනු සාක්ෂ්‍ය, ශුද්ධාත්ම බලය හා මගපෙන්වීම මත පදනම් විය යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**6.** (i) පළමු සියවස් හතර තුළ ක්‍රිස්තියානිවරුන් අත් විඳී විවිධාකාර පීඩන මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) "අත් විඳීමට සිදුවන පීඩන හමුවේ කිතුනුවන් දක්වන ලද ප්‍රතිචාරය වර්තමාන ලෝකයට ප්‍රේමයේ, සමාවේ සහ සහෝදරත්වයේ පණිවුඩයක් ගෙන ඒමට සමත් වී ඇත." අදහස් දක්වන්න. (ලකුණු 10යි)

**7.** (i) යාචක පැවිදි නිකා නම් කර, එම කාලයේ පිරිහී තිබූ සභාවේ අධ්‍යාත්මිකත්වය වර්ධනයට එම නිකායන් සිදු කළ සේවා පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) 'සුවිශේෂක දිළිඳුකම' සැමවිටම සභාව ලෝකය තුළ ගැලවීමේ සලකුණක් වීමට උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**8.** (i) 'මානව උදාරත්වය' සම්බන්ධයෙන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) මානව උදාරත්වය කෙළසූ අවස්ථා **දෙකක්** සඳහන් කර, මානව උදාරත්වය ආරක්ෂා කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

* * *